# එකමුතු වඳුරු රංචුව



බිනුවරී සෙසාක්යා බණ්ඩාර

# එකමුතු වඳුරු රංචුව

## බිනුවරී සෙසාක්යා බණ්ඩාර

| | | |
|---|---|---|
| කතාව හා චිත්‍ර | - | බිනුවරී සෙසාක්යා බණ්ඩාර |
| ISBN | - | 978-624-206-847-3 |
| දිනය | - | 2023-12-05 |

# පිදුම

පාසල් දිවියේ

සොඳුරු මතකය වෙනුවෙන්

ළබැඳි මිතුරියන්ට

ආදරයෙන් පුදමි

එකමුතු වඳුරු රංචුව

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශෂිකලා සේනාධීර

විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 10 20

එකමත් එක කාලෙක වඳුරු පැටියෙකුයි, වඳුරු අම්මා කෙනෙකුයි, වඳුරු තාත්තා කෙනෙකුයි ජීවත් වුණා.

ඉතිං මේ වඳුරු පැටියාගේ අම්මායි තාත්තයි කෑම හොයන්න ගියා. එතකොට මේ වඳුරු පැටියා එයාලගේ ගහ උඩ තනියම .

ඒ ගහට ලොකු රාජාලියෙක් ඇවිත් වඳුරු පැටියාව අරන් ගියා.



ඉතිං ඊට පස්සේ අම්මයි, තාත්තයි කෑම හොයලා ගහට එනකොට පැටියා නෑ.

ඒ දෙන්නා පැටියාව කැලේ හැමතැනම හෙව්වා .

ඊට පස්සේ ඒ ගැන එයාලාගේ වඳුරු රජතුමාට කිව්වා.

ඒ වඳුරු රජතුමාගේ නම තමයි රූනෝ. මේ රූනෝ රජතුමා දක්ෂයි, උපායශීලියි සහ නිර්මාණශීලීයි.



ඊට පස්සේ රූනෝ රජතුමා වඳුරු ගමේ වඳුරෝ හැමෝටම කතා කරලා මෙහෙම කිව්වා.

"මේ අම්මයි, තාත්තයි එයාලගේ පැටියව ගහේ තනියම තියලා කෑම හොයාගෙන එන්න ගිහින්. ඒ ගිහින් ගහට එනකොට ගහේ වඳුරු පැටියා නැල්ලු.

ඉතිං ඒ වඳුරු පැටියා කොහේ හරි ඉන්නවා කවුරුහරි දැක්කා ද?"



එතකොටම එක වඳුරෙක් අත ඉස්සුවා.

“මොකක්ද ඔයා ඒ ගැන දන්නේ ?’’ රජතුමා ඇහුවා.

“රජතුමනි මම දැක්කා ඒ පැටියා හිටපු ගහ ළඟ ඉඳන් රාජාලියෙක් එයාගේ අත්වල මොනවාදෝ අරන් යනවා. ඒ අරන් ගියේ වඳුරු පැටියාද දන්නේ නෑ’’ වඳුරා කිව්වා. “ඒ රාජාලියා ගියේ මොන දිශාවට ද?’’ රජතුමා ඇහුවා.“ඒ රාජාලියා නම් ගියේ උතුරු දිශාවට රජතුමනි” වඳුරා කිව්වා.



“අපි එහෙනම් උතුරු දිශාවට යමු” කිව්ව රජතුමා වඳුරු රංචුව සමඟ උතුරු දිශාවට පිටත් වුණා.

යනකොට මෙයාලට හම්බවුණා ලොකු කන්දක්.

“අනේ රජතුමනි මේ කන්ද යන්නම ඕනි ද?” එක වඳුරෙක් ඇහුවා. ‘‘එහෙම කියලා බැනේ. වඳුරු පැටියාව බේර ගන්න එපැයි.’’ රජතුමා ඒ වඳුරාට කිව්වා.



ඉතිං ඊට පස්සේ එයාලට රාජාලියෙක්ගේ ලොකු කූඩුවක් හම්බ වුණා.

හැබැයි ඒ රාජාලියා නිදාගෙන හිටියේ. ඉතිං ඊට එහා පැත්තේ ලොකු දොරක් තිබුණා. හැබැයි ඒ දොර අගුලු දාලා තිබුණේ.

ඉතිං මේ වඳුරු රංචුව දැක්කා රාජාලියාගේ කූඩුව ඇතුලේ රත්තරන් පාට යතුරක් තියෙනවා.

“වඳුරනි මට කෙක්කක් වගේ කෝට්ටක් අරන් එන්න.”

වඳුරු රජතුමා වඳුරන්ට රහසින් කිව්වා.

එක වඳුරෙක් කෙක්කක් වගේ කෝට්ටක් අරන් ආවා.

වඳුරු රජතුමා ඒ කෙක්කෙන් අර කූඩුවේ තිබුණ රත්තරන් යතුර හෙමිහිට ගත්තා.

මේ වඳුරු රජතුමා ඒ රත්තරන් යතුරෙන් ඒ ලොකු දොර ඇරියා. ඒ දොර ඇරියා ම දැක්ක දෙයින් පුදුම වුණා. ඒක ඇතුලේ හා පැටවු , මුව පැටවු ,ලේන් පැටවු වගේ පැටවු ගොඩක් හිටියා.

ඉතිං මේ වඳුරු රංචුව ඒ පැටවු ඔක්කොම බේර ගත්තා. ඊට පස්සේ ඒ බේර ගත්ත පැටවු ටික එයාලගේ දෙමව්පියන්ට භාර දුන්නා.

" අපි ආයේ කවදාවත් ඔයා ලොකු වෙනකල් තනියම තියන්නේ නෑ."

වඳුරු පැටියාගේ අම්මයි, තාත්තයි පැටියාට කිව්වා.

"ස්තූතියි රජතුමනි" අම්මයි , තාත්තයි , පැටියයි රජතුමාට කිව්වා.

ඊට පස්සේ වඳුරු තාත්තයි, වඳුරු අම්මයි, වඳුරු පැටියයි සතුටින් ජීවත් වුණා.



නිමි.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20